2021 Dinamina and Silumina -buddeni -buddeni.k@thirdshift.lk -0771617186

සංචාරක කර්මාන්තයට යළිත් වසන්තය

ගිය මාසේ වාර්තාගත පිරිසක්

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් - 19 ලෝක වසංගත තත්ත්වය හේතුවෙන් සංචාරක කර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල වුවද පසුගිය සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා විදේශිකයන් 13,547 දෙනෙකු පැමිණි තිබේ.

එය මේ වසරේ මසත් තුළ මෙරටට පැමිණි වැඩිම විදෙස් සංචාරකයන් පිරිස වන අතර ඒ අනුව මේ දක්වා කාලය තුළ 2021 වසරේ දී විදෙස් සංචාරකයන් 37,924 දෙනෙකු සංචාරය සඳහා ශ්‍රී ලංකාවට පැමිණි තිබෙන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පෙන්වා දෙයි.

පසුගිය සැප්තැම්බර් මාසයේ දී විදෙස් සංචාරකයින් 13,547 ක් මෙරටට පැමිණ ඇති අතර මෙය 2021 වසරේ තනි මාසයක් තුළ මෙරටට පැමිණි වැඩිම සංචාරකයන් ගණන බවද ඒ අනුව ඉදිරියේ දී මෙරටට පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව ඉහළ යනු ඇතැයි ද එම අධිකාරිය නිකුත් කළ නවතම වාර්තාවක් මඟින් පෙන්වා දෙයි.

මේ වසරේ අගෝස්තු මාසයේ දී විදෙස් සංචාරකයන් 5,040 දෙනෙකු මෙරටට පැමිණි තිබෙන අතර එය පසුගිය සැප්තැම්බර් මාසයට පෙර එක් මසක් තුළ මෙරටට පැමිණි වැඩිම සංචාරකයන් පිරිස විය. කෙසේ වුවද පසුගිය 2020 වසරේ දී විදේශීය සංචාරකයන් 507,704 දෙනෙකු සංචාරය සඳහා ශ්‍රී ලංකාවට පැමිණ තිබේ.

මේ අතර පසුගිය සැප්තැම්බර් මාසයේ දී මෙරටට පැමිණි සංචාරකයන් අතරින් 8,258 දෙනෙකු ඉන්දියාවෙන් පැමිණ තිබෙන අතර 466 දෙනෙකු ජර්මන් ජාතිකයන් ද 309 දෙනෙකු බ්‍රිතාන්‍ය ජාතිකයන් ද වෙති. ඊට අමතරව රුසියාවෙන් 304, කැනඩාවෙන් 265, ස්පාඤ්ඤයෙන් 182ක් ආදි වශයෙන් සංචාරකයන් ශ්‍රී ලංකාවට පැමිණ තිබෙන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහන් කරයි.

මේ අතර ඊශ්‍රායලය, චෙක් ජනරජය, ෆින්ලන්තය, පෝලන්තය හා පෘතුගාලය මෙරටට සංචාරකයන් ගෙන්වා ගැනීමට වැඩි විභවයක් පවතින රටවල් ලෙසින් සංචාරක සංවර්ධන අධිකාරිය හඳුනාගෙන තිබේ.

අපනයන කෘෂිබෝග මිළ ගණන්

2021.10.05 දිනෙන් අවසන්වූ සතිය තුල පැවති සාමාන්‍ය මිල (කිලෝ ග්‍රෑමයට රුපියල්)

බෝගය	දිස්ත්‍රික්කය	මහනුවර	මාතලේ	කුරුණෑගල	පුත්තලම	රත්නපුර	බදුල්ල	මොණරාගල	කෑගල්ල	කළුතර	ගාල්ල	මාතර	නුවරඑළිය	මඩකලපුව
කුරුඳු	Alba					3,000	-	-	-	-	3,100	-	3,400	-	-
	C-5 Sp					2,850	-	-	-	-	2,760	-	2,933	-	-
	C-5					2,650	-	-	-	2,230	2,595	-	2,670	2,650	-
	C-4					2,500	-	-	-	1,750	2,460	-	2,593	2,600	-
	M-5					2,200	-	-	-	-	2,200	-	2,513	-	-
	M-4					2,200	-	-	-	-	2,000	-	2,400	-	-
	H-1					2,000	-	-	-	-	1,920	-	2,264	2,250	-
ගම්මිරිස්	1 ශ්‍රේණිය	853	837	795	-	810	830	-	775	835	800	-	834	820	820
	2 ශ්‍රේණිය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
කරාබු 1 ශ්‍රේණිය		1,515	1,529	1,500	-	1,300	1,125	-	1,150	1,350	1,000	-	1,517	1,500	950
කෝපි 1 ශ්‍රේණිය		1,130	1,154	1,145	-	1,100	1,050	-	1,150	1,120	1,135	-	1,121	1,100	1,000
කොකෝවා 1 ශ්‍රේණිය		375	375	-	-	-	-	-	-	-	-	-	-	-	370
කරදමුංගු ලංකා ග්‍රීන්		-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
සාදික්කා 1 ශ්‍රේණිය		1,020	996	900	-	-	-	-	-	-	-	-	-	-	-
විසාවාසි 1 ශ්‍රේණිය		3,900	3,941	3,500	-	-	-	-	-	-	-	-	-	-	-
බුලත් කොළ 1000ක්		-	-	-	-	-	-	-	-	6,000	-	-	-	-	-
පුවක් කරාබෑකා සි.ග්‍රෑ.1ක්		965	875	945	-	900	781	-	885	950	867	-	939	960	925

නිෂ්පාදනය	හ'කොට	ර' පුර	ගාල්ල	මාතර
කුරුඳු කොළ තෙල් (සි.ග්‍රෑ./රු.)	-	-	-	4,100
පැහෙරි තෙල් (සි.ග්‍රෑ./රු.)	3,000	0	-	2,000

දත්ත සැකසුම් - අපනයන කෘෂිකර්ම ආර්ථික පර්යේෂණ අංශය
අපනයන කෘෂිකර්ම බෝග වගාකිරීම හා සැකසීම පිළිබඳ සියළු තාක්ෂණික තොරතුරු සහ උපදෙස් නොමිලේ ලබාගැනීම් සඳහා අපනයන කෘෂිකර්ම චැප්ති හිලධාරි හමුවන්න.
ස්ථානය - ගොවිජන කේන්ද්‍රය දිනය - සදුදා
වේලාව -පෙ.ව. 8.30 සිට ප.ව. 4.15

වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න - www.dea.gov.lk

සන්නිවේදන අංශය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 1085, නුවර පාර, පේරාදෙණිය
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - අපමිට සරු හෙට දිනකට
081 2388651

ශ්‍රී ලංකා ප්‍රංස පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපති ධුරය ඇමැති නාමල්ට

ස්වර්ණා විජේකෝන්, රුවන්ත නිතුල්ගස්පිටිය

තරුණ හා ක්‍රීඩා ඇමැති සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය ඇමැති නාමල් රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා ප්‍රංස පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව සභාපතිවරයා ලෙස පෙරේදා (6දා) තෝරා ගෙන ඇත.

ශ්‍රී ලංකා ප්‍රංස පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නිලධාරී මඩුල්ල තෝරා පත්කර ගැනීමේ විශේෂ රැස්වීමක් කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු සංකීර්ණයේ දී පැවැත්විණි. මේ අවස්ථාවට ශ්‍රී ලංකාවේ ප්‍රංස තානාපති එරික් ලැවර්තු සහ පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක යන මහත්වරුද සහභාගි වූහ.

ලංසු කැඳවීමයි

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

ලංසු අංක : 070/T/2020

කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට ලීටර් 18.9 වතුර බෝතල් 30,000 ක් සැපයීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සභාපති විසින් කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට **ලීටර් 18.9 වතුර බෝතල් 30,000 ක් සැපයීම** සඳහා ලංසු කැඳවනු ලැබේ.

ලංසු ලිපි ලේඛන කට්ටලයක් ආපසු නොගෙවනු ලබන රුපියල් **දෙදහසක (රු. 2,000.00)** මුදලක් සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම්දම කළමනාකරණ අංශයට ගෙවීමෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා ලංසු තබන්නා විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම්දම කළමනාකරණ අංශය වෙතින් **2021.10.11 වන දින සිට 2021.11.01** වන දින දක්වා ඕනෑම වැඩකරන දිනයකදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලිපිලේඛන කට්ටල ලබාගත හැකිය. අවශ්‍ය නම් ඉහත ලංසු ලිපිලේඛන සැපයුම් දම කළමනාකරණ අංශ කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ලංසු තබන්නන් ඔවුන්ගේ ලංසු කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. තවද, ලංසු තබන්නන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ගේ සීල් තබන ලද ලංසු ඉහත ලිපිනයට පොද්ගලිකව ද ගෙනවිත් බාරදිය හැකිය.

ලංසු තැබීම 2021 නොවැම්බර් මස 02 වන අඟහරුවාදා දින ප.ව. 2.00 ට අවසන් වන අතර අදාළ ලංසු විවෘත කිරීම ඒ සමගම සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක පිහිටි සැපයුම් දම කළමනාකරණ අංශයේදී සිදු කෙරේ. ලංසු තබන්නන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවේ දී එයට සහභාගි විය හැකිය.

ලංසු සුරැකුම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් බැංකුවකින් සභාපති, සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම වෙත ඉල්ලුම මත ගෙවෙන සේ නිකුත් කරන ලද **රුපියල් අසූඑක් දහස් හයසියයක (රු. 81,600.00)** වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක්, ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සැපයුම්දම කළමනාකරණ අංශයේ දුරකථන අංක 011-2264103 / 011-2264105 ඇමතීමෙන්, head.scm@airport.lk විද්‍යුත් ලිපිනයෙන් හෝ අපගේ www.airport.lk යන අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

සභාපති,
සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,
කටුනායක.

ගුරු විදුහල්පති වැටුප් ගැටලුව විසඳීමට සර්ව පාක්ෂික සමුළුවේදී යෝජනාවලියක්

සුභාෂිණී සේනානායක

ගුරු විදුහල්පති වැටුප් ගැටලුව විසඳීමට එකඟතාවක් ඇති කර ගැනීම සඳහා අභයාරාමාධිපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන්ගේ මූලිකත්වයෙන් පෙරේදා (6දා) එම විහාරස්ථානයේදී පැවැති සර්ව පාක්ෂික සමුළුවේදී කරුණු හයක් ඇතුළත් යෝජනාවලියක් සම්මත විය. එමෙන්ම එහිදී 'සුබෝධනී' වාර්තාව ක්‍රියාත්මක කරන ලෙසද ගුරු විදුහල්පතිවරු රජයෙන් ඉල්ලා සිටියේය.

මෙම සර්ව පාක්ෂකි සමුළුවේ දෙවැනි පෙළ මුලසුන හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතාට හිමිව තිබූ අතර සාර්ව පාක්ෂික සමුළුව සඳහා විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස, හිටපු කථානායක කරු ජයසුරිය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර, සමඟි ජනබලවේගයේ මහ ලේකම් රංජිත් මද්දුම බණ්ඩාර, ශ්‍රී ලංකා පොදුජන පෙරෙමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන පාර්ලිමේන්තු මන්ත්‍රී විජයදාස රාජපක්ෂ, අතුරලියේ රතන හිමි, හිටපු අධ්‍යාපන ඇමැති අකිල විරාජ් කාරියවසම්, ජාතික හෙළ උරුමයේ හිටපු පළාත් සභා මන්ත්‍රී නිශාන්ත ශ්‍රී වර්ණසිංහ සහ නීතිඥ ගුණරත්න වන්නිනායක මහත්වරු ඇතුළු පක්ෂ විපක්ෂ දේශපාලන නියෝජිතයන් රැසක්ද ගුරු විදුහල්පති වෘත්තීය සමිති 13ක නියෝජිතයන්, නීතීඥයන් ඇතුළු සංවිධානරැසක නියෝජිතයෝ එක්ව සිටියහ.

එම සාකච්ඡාවේදී හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා ගුරු හා විදුහල්පති සේවයේ වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලිය වෙනුවෙන් තමන් කොන්දේසි විරහිතව මැදිහත්වන බව ප්‍රකාශ කළේය. මෙම සමුළුවට සමඟි ජනබලවේගයේ නායක, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ද සහභාගි විය.

ගුරු - විදුහල් වැටුප් විෂමතාට එරෙහි ජාතික එකමුතුව නියෝජනය කරන ගුරු සංගම් 13 ක් නියෝජනය කරමින් නියෝජිතයෝ ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

සාක් රටවල විනිසුරු පුහුණු ඇකඩමිය මෙරට පිහිටුවීමේ යෝජනාවක්

රෝෂන් තුෂාර

ශ්‍රී ලංකාව ඇතුළු සාක් කලාපීය රටවල විනිසුරුවරුන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අන්තර් ජාතික මට්ටමේ විනිසුරුවරුන් පුහුණු කිරීමේ ඇකඩමියක් පිහිටුවීමට රජය තීරණය කර ඇත.

විනිසුරුවන් පුහුණු කිරීමේ ආයතනයක් පිහිටුවීම සම්බන්ධයෙන් අධිකරණ ඇමති එම්.යූ.එම්. අලි සබ්රි මහතා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට අනුමැතිය ලැබී ඇති අතර ඊට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විද්වත් කමිටුවක් ද පසුගිය දා (6) පත් කෙරිණි.

මෙම විද්වත් කමිටුවට අධිකරණ ඇමැතිවරයා හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජනාධිපති නීතිඥ බුවනෙක අළුවිහාරේ මහතාගේ සම සභාපතීත්වයෙන් අධිකරණ අමාත්‍යාංශ ලේකම් එම්.එම්. පී.කේ. මායාදුන්නේ, අභියාචනාධිකරණ විනිසුරු රුවන් ප්‍රනාන්දු, කෘෂිකර්ම අමාත්‍යාංශයේ හිටපු ලේකම් හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හිටපු අධ්‍යක්ෂක බී. විජේරත්න, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති, ජනාධිපති නීතිඥ සාලිය පිරිස් හා ගෘහ නිර්මාණ ශිල්පී මුරබ් ස්මයිල් යන මහත්වරුන් සමාජිකයන් ලෙස පත් කර ඇත.

විද්වත් කමිටුව මාස තුනක් ඇතුළත සිය නිර්දේශ ඉදිරිපත් කළ යුතු බව අධිකරණ අමාත්‍යාංශය දැනුම් දී තිබේ.

මැද පෙරදිග යන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට බූස්ටර් එන්නතක්

කුවේට්, සෞදි සහ කටාර් යන රටවල සේවය පැමිණීමට අදහස් කරන සයිනොෆාම් එන්නත් මාත්‍රා දෙකම ගත් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් එම රටවලට පිවිසීමට පෙර බූස්ටර් එන්නතක් ලෙස ෆයිසර්, මොඩර්නා හෝ ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනිකා යන වර්ගයන්ගෙන් එක් මාත්‍රාවක් ගෙන තිබිය යුතු බව සේවායෝජකයන් දන්වා ඇතැයි විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අතිරේක සාමාන්‍යාධිකාරී මංගල රන්දෙණිය මහතා පවසයි.

එමනිසා විදෙස්ගත වීමට අදහස් කරන ශ්‍රමිකයන්ට අවශ්‍ය එන්නත් ප්‍රමාණය කඩිනමින් දෙන ලෙස සෞඛ්‍ය අංශවලින් ඉල්ලීමක් කර තිබෙන බවද හෙතෙම කීවේය.

විදේශ රැකියා සඳහා පිටත්ව යෑමට විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුද්ගලයන් 20,000 කට ආසන්න පිරිසක් මේ වන විටත් ලියාපදිංචි වී ඇති අතර ඔවුන්ගෙන් 8,000 කට පමණ ෆයිසර් එන්නත දී මේ වන විටත් දී ඇත.

"කාගිල්ස්" අබණ්ඩව දෙවන වරටත් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම සමාගම් 10 අතරට

CIMA, ICCSL සහ Daily FT විසින් අඛණ්ඩව දෙවන වරටත් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම සමාගම් 10 අතරට කාගිල්ස් සමාගම තෝරාගෙන ඇත. එය කාගිල්ස් සමාගමට නිහතමානී ආඩම්බරයකි. මෙම ඇගයුම ලෝක වසංගතය හමුවේ පවා නොසැලී සිය ප්‍රජාවට මුල් තැන ලබා දුන් කාගිල්ස් සමාගම් ආකෘතියට ලද ඇගයුමක් වේ. සැමවිටම අප සමාගමේ දර්ශනය වූයේ ප්‍රජා සංවර්ධනයට අවධානය යොමු කිරීමෙන් ලාභය ඉබේම ඉපැයෙන බවට ඇති විශ්වාසයයි.

ප්‍රජාවට මුල්තැන

අත්‍යවශ්‍ය සේවා සපයන සහ ප්‍රමුඛ පෙළේ ආහාර සමාගමක් ලෙස අප වසංගත කාලය තුළ පවා පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා නොඅඩුව සැපිරීමට කටයුතු කළෙමු. දිවයින පුරා ගොවීන් වෙළඳපොළක් නොමැතිව අසරණ වූ මොහොතක දහස් ගණනකගේ ජීවිකාව සුරක්ෂිත කරමින් ඔවුන්ට වෙළඳපොළක් සැපයීමට අපි කටයුතු කළෙමු. එසේම එක කිරි බිඳුවක්වත් අපතේ යන්නට නොදී අපි අපගේ දෛනික කිරි එකතුකිරීම දිනකට ලීටර් 180,000 දක්වා ඉහළ නැංවූයෙමු. 2020/21 මූල්‍ය වසරේදී පමණක් කාගිල්ස් සමාගම විසින් කිරි සහ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා රුපියල් බිලියන 9කට වැඩි සෘජු ආදායමක් උපයා දී ඇත.

පසුගිය වසරේ ලෝක වසංගතය නිසා පළමු වරට රට වසා දැමූ අවස්ථාවේදී කුඩා පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දුන් අභියෝගවලට විසඳුමක් ලෙසින් අප 'ගමෙන් ගෙදරට" යන ව්‍යාපෘතිය 2020 සැප්තැම්බර් මාසයේ ආරම්භ කළෙමු. එහි අරමුණ වූයේ අපගේ දේශීය ව්‍යවසායකයින් වඩා විශාල වෙළඳපොළක් වෙත සමීප කරවීමය. ඔවුන්ට ඇසුරුම් කිරීම, අලෙවිය, සහ තත්ත්ව ආරක්ෂාව අතින් පමණක් නොව කාගිල්ස් බැංකුව හරහා අඩු වියදම් මූල්‍ය පහසුකම් සපයමින් ඔවුන්ගේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ද කාගිල්ස් සමාගම කටයුතු කරයි.

ආර්ථිකයට සවියක්

අපගේ අමුද්‍රව්‍ය බොහොමයක් දේශීයව සපයාගනිමින් ගෝලීය වෙළඳනාමයන් හා තරඟකාරී වන ලෙසින් අගය එකතු කළ නිෂ්පාදන සපයන කාගිල්ස් සමාගම, රටට විදේශ විනිමය ඉතිරි කරමින් වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. ප්‍රමිතිය සහ නවෝත්පාදනය කෙරෙහි අප දක්වන අවධානය හේතුවෙන් අපේ ආහාර නිෂ්පාදනයන් ප්‍රමුඛ පෙළේ ජාතික වෙළඳනාමයන් බවට පත්වී ඇත. පසුගිය මාස 18 පුරාවට පැවති අභියෝගාත්මක කාලසීමාවේදී පවා කාගිල්ස් සමාගම නොනැවතී සෑම ව්‍යාපාර අංශයකම සහ රට පුරා ආයෝජනයන් සිදු කරනු ලැබිය. 2020/21 මූල්‍ය වසර තුළ කාගිල්ස් සමූහය විසින් සිදුකළ සමත ආයෝජනයන්ගේ ප්‍රමාණය රුපියල් බිලියන 6.4 කි. ඉන් ශ්‍රී ලංකාව ගැන සහ වත්මන් අභියෝගාත්මක තත්ත්වයෙන් මිදී පෙර පරිදිම රටට නැවතත් නැඟී සිටීමේ හැකියාව ගැන අපේ විශ්වාසය පිළිඹිබු වේ. ප්‍රමුඛ පෙළේ ශ්‍රී ලාංකික සමාගමක් ලෙසින් ප්‍රජා සංවර්ධනය සිදු කරමින් සහ හවුල්කරුවන්ට වටිනාකම් එකතු කරමින් කාගිල්ස් සමාගම තිරන්තරයෙන් සිය ආයෝජනයන් සිදුකිරීමට කැපවී සිටී.

අපගේ ශක්තිය අපගේ කණ්ඩායමයි

මෙම ඇගයුම ලබාගැනීමට සමාගමට හැකියාව ලබා දුන් එකම හේතුව වන්නේ ඉතාම අභියෝගාත්මක අවස්ථාවන්හිදී පවා සේවය සැලසීමට කැපවී සිටිනා අපගේ කණ්ඩායමයි. වසංගතය කාලයේදී අපගේ මූලික අරමුණ වූයේ අපගේ කණ්ඩායම ආරක්ෂා කරමින් ඔවුන්ගේ මානසික, ශාරීරික සහ මූල්‍ය යහපැවැත්ම සුරක්ෂිත කිරීමය. අවශ්‍ය සහයෝගය ලබාදෙමින් කණ්ඩායමේ ආත්ම විශ්වාසය ගොඩනංවන අතරේ අප ඔවුන්ට එත්තත්කරණය ලබාදීමට ද අවශ්‍ය පියවර ගත්තෙමු. අද වන විට 12,000 ක් පමණ වන කාගිල්ස් කණ්ඩායමෙන් 98% ක සාමාජික පිරිසක් එන්නත් ලබාගෙන තිබේ.

එක්ව ඉදිරියට

අපගේ පාරිභෝගිකයින්ගේ අවශ්‍යතාවයන් සැපිරීම සඳහා අපගේ ගොවීන් සහ සැපයුම්කරුවන්ගෙන් ලැබෙන දායකත්වය අතිමහත්ය. ඔවුන්ට ස්තූතිවන්ත වන අතරම කාගිල්ස් සමාගම සෑමවිටම සිය හවුල්කරුවන් සමඟ සිටින බවට සහතික වේ. අප කෙරෙහි විශ්වාසය තබා ඇති අපගේ පාරිභෝගිකයින්ට අප හෘදයාංගමව ස්තූතිවන්ත වන්නෙමු. වසර 177 ක උරුමය සමඟ රටේ පැරණිතම සහ විශ්වසනීයම සමාගමක් වන කාගිල්ස් සිය වටිනාකම්වලට අවංකව කටයුතු කරමින් දැරිය හැකි මිලට හොඳම දේ සපයමින් රටට සේවය සැලසීමට නිරන්තරයෙන්ම කැප වනු ඇත.

මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට එරෙහිව ජාතික සංවිධාන එකමුතුවෙන් පැමිණිල්ලක්

උපාලි කරුණාරත්න

අමෙරිකන් සමාගමක් සමඟ යුගදනවි බලාගාර ගිවිසුම අත්සන් කිරීම, ජාතික බලශක්ති ප්‍රතිපත්තියට පටහැනි, ඇමැති මණ්ඩලය නොමඟ යවමින් හා විවෘත ටෙන්ඩර් කැඳවීමකින් තොරව රටට විශාල පාඩුවන හානිදායක කොන්දේසි ඇතුළත් ගිවිසුමක් බව සඳහන් කරමින් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට එරෙහිව ජාතික සංවිධාන එකමුතුවේ නියෝජිතයෝ ඊයේ (07) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කළේය.

නිවෙස්ගතව ප්‍රතිකාර ලබන ආසාදිතයන්ගේ අඩු වීමක්

කොවිඩ් රෝගීන් සඳහා වූ නිවෙස්ගත ප්‍රතිකාර ක්‍රමවේදය යටතේ තවදුරටත් සක්‍රීය තත්ත්වයේ පසුවන රෝගීන් සංඛ්‍යාව 5,628 දෙනෙකු දක්වා අඩුවී තිබේ.

පවුල් වෛද්‍ය විද්‍යා විශේෂඥ වෛද්‍ය මල්කාන්ති ගල්හේන මහත්මිය පැවසුවේ පසුගිය සති කිහිපය සමඟ සැසඳීමේදී එය විශාල අඩුවීමක් දැකිය හැකි බවය.

නිවෙස්ගත ප්‍රතිකාර ක්‍රමවේදය යටතේ පෙරේදා (6දා) දිනය වන විට කොවිඩ් රෝගීන් 91,745 දෙනකු ලියාපදිංචි වී සිට ඇති අතර ඉන් 84,344 දෙනකු සුවය ලබා ඇත.

එම ප්‍රතිකාර ක්‍රමවේදයට යොමු කළ කොවිඩ් රෝගීන්ගෙන් රෝහල් වෙත යොමු කර ඇත්තේ 1%ක ප්‍රතිශතයකි. එනම් රෝගීන් 1,330 දෙනෙකු පමණක් බව විශේෂඥ වෛද්‍ය මල්කාන්ති ගල්හේන මහත්මිය පැවසීය.

මේ අතර පෙරේදා (6දා) දිනය වන විට මෙරටින් හඳුනා ගත් කොවිඩ් ආසාදිතයන් ගණන 776කි. මේ දක්වා මෙරටින් වාර්තා වූ සමස්ත ආසාදිතයන් ගණන 522,778 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර 478,326 දෙනෙකු ප්‍රතිකාර කාල සීමාව අවසන් කර ඇතැයි වසංගත රෝග විද්‍යා අංශයෙන් වාර්තාවේ.

තවදුරටත් ප්‍රතිකාර ලබන සංඛ්‍යාව 31,267කි. මෙරටින් වාර්තා වූ සමස්ත කොවිඩ් මරණ සංඛ්‍යාව 13,185ක් දක්වා ඉහළ ගොස් තිබේ.